(6)
00094

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන 2018/2019

අවසාන පරීක්ෂණය - 2020

ESC2316/EPA2816/EPC2816 - පෙර පාසල් ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ ක්‍රම සහ කළමනාකරණය

කාලය - පැය තුනයි.(03)

---

දිනය - 19.07.2020 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. කළමනාකරණය යන සංකල්පය සුදුසු නිර්වචනයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. සම්භවන ඇගයීම යන්න උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

03. සිසුන් ඇගයීම සඳහා නිරීක්ෂණය වඩා වැදගත් වේ. ඉහත වගන්තිය තහවුරු කිරීමට කිරීමට කරුණු තුනක් (03) ලියන්න.

04. පෙර පාසල් ගුරුවරයෙකුට ශිෂ්‍ය කාර්ය සාධන ගොනුවක ඇති ප්‍රයෝජන පහක් (05) ලියන්න.

05. පෙර පාසලක සති සැලසුම් පවත්වාගෙන යාමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පෙර පාසලක සිසුන් සඳහා ඉගෙනුම් ආධාරක සකස් කිරීමේ දී සලකා බැලිය යුතු සාධක පහක් (05) නම් කරන්න.

07. පෙර පාසලක වාර්තා පවත්වාගෙන යාමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් (05) සඳහන් කරන්න.

08. පෙර පාසලක සෙල්ලම් මිදුලක් පවත්වාගෙන යාමේ දී සලකා බැලිය යුතු සාධක පහක් (05) ලියන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. පෙර පාසලක පහත සඳහන් අංග සකස්විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

- ගොඩනැගිල්ල
- මේස පුටු සහ අනෙකුත් පන්තිකාමර උපකරණ
- එළිමහන් පරිසරය
- සෙල්ලම් මිදුල
- සනීපාරක්ෂක පහසුකම් (ලකුණු 4 x 5 = 20)

10. (i) පෙර පාසලක් කාර්යක්ෂම ලෙස කළමනාකරණයේ දී ගුරුවරයාගේ භූමිකාවේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය සංවර්ධනය කිරීම හා සම්බන්ධ රජයේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) 'තක්සේරුකරණය' හා 'ඇගයීම' යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) "සිසුන්ගේ සංවර්ධනය සඳහා වඩාත්ම වැදගත් සාධකය වන්නේ තක්සේරුකරණ ක්‍රියාවලියයි." ඉහත අදහස තහවුරු කිරීමට කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(iii) ඉගෙනුම් ආධාරක යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

12. (i) පෙර පාසල් වියේ දරුවන්ගේ මූලික අවශ්‍යතා හතරක් (04) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පෙර පාසලක එළිමහන් ක්‍රියාකාරකම්වල ඇති වැදගත්කම තර්කානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. පෙර පාසල් පන්ති කාමරයක ඵලදායී කළමනාකරණය පෙර පාසල් ශිෂ්‍යයාගේ පූර්ණ සංවර්ධනයට උදව් වන අයුරු පහත ක්ෂේත්‍ර යටතේ පැහැදිලි කරන්න.

- කායික සංවර්ධනය
- මානසික සංවර්ධනය
- චිත්තවේග සංවර්ධනය
- සමාජ සංවර්ධනය
- සදාචාර සංවර්ධනය (ලකුණු 4 x 5 = 20)

හිමිකම් ඇවිරිණි.